# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1637/16 – 2010 ජනවාරි 21 වැනි බ්‍රහස්පතින්දා – 2010.01.21

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: අයිආර්/15/10/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්,

උදුලා ඉන්ද්‍රානි දොඩන්ගොඩ මෙනෙවිය, කැප්පෙටිපොළ මාවත, පරගොඩ පාර, බුලත්සිංහල

හා

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07,

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය, අතාවුද සෙනෙවිරත්න වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බොරලැස්ගමුව, අබේරත්න මාවතේ හි අංක 28 හි සුගතදාස කාරියවසම් මහතා පත්කර, ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

අතාවුද සෙනෙවිරත්න,
කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය.

2010 ජනවාරි මස 15 වැනි දින,
කොළඹ දී ය.

1A – G12351 – 395 (2010 / 01)

මගේ අංකය: අයිආර්/15/10/2008.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

උදුලා ඉන්ද්‍රානි දොඩන්ගොඩ මෙනෙවිය, කැප්පෙටිපොළ මාවත, පරගොඩ පාර, බුලත්සිංහල

හා

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07,

අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ –

(1) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් 2000 හා 2001 වර්ෂ වලදී V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර හා IV වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර අධ්‍යක්ෂ තනතුරු වලට උසස් වීම ලබා දීමේදී ඒ සඳහා අයදුම් කරනු ලැබූ එහි VII වන ශ්‍රේණියේ ලිපිකාරිණියක් වශයෙන් සේවයෙහි යෙදී සිටි උදුලා ඉන්ද්‍රාණි දොඩන්ගොඩ මෙනෙවියට එම උසස් වීම් ලබා නොදීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඇයට කුමන සහනයක් හිමි විය යුතුද?

(2) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් 2007 වර්ෂයේදී IV වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුරුවලට උසස්වීම ලබා දීමේදී ඒ සඳහා අයදුම් කරනු ලැබූ එහි VII වන ශ්‍රේණියේ ලිපිකාරිණියක් වශයෙන් සේවයේහි යෙදී සිටි උදුලා ඉන්ද්‍රාණි දොඩන්ගොඩ මෙනෙවියට එම උසස් වීම ලබා නොදීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් වූයේද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඇයට කුමන සහනයක් හිමි විය යුතුද යන්න හා

(3) 1995.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ VII වන ශ්‍රේණියේ ලිපිකාරිණියක් වශයෙන් ස්ථිර පත්වීමක් ලැබූ උදුලා ඉන්ද්‍රාණි දොඩන්ගොඩ මෙනෙවියට එම තනතුරෙහි ශ්‍රේණිගත උසස් වීම ලබා දීම එම කොමිෂන් සභාව විසින් 2008 වර්ෂය දක්වා ප්‍රමාද කිරීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම් ඇයට කුමන සහනයක් හිමි විය යුතුද යන්න පිළිබඳව ද වේ.

ඩබ්ලිව්. ජේ.එල්. යූ. විජයවීර,
කම්කරු කොමසාරිස්.

2010 ජනවාරි මස 06 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස්තැනගේ කාර්යාලයේදී දින යොදන ලදී.

02 – 103

---

මගේ අංකය: IR/13/17/2008.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4(1) වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ඒ. ඩබ්ලිව්. සමරසූරිය මහතා, 'සමරසිරි', කෝට්ටේගොඩ.

හා

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය, අතාවුද සෙනවිරත්න වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් දෙහිවල, ඇතුළු වැන්ඩර්වර්ට් පෙදෙස, අංක 12, ඩබ්ලිව්. ජී. ඩීන් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

අතාවුද සෙනෙවිරත්න,
කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය.

2010 ජනවාරි මස 15 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/13/17/2008.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

ඒ. ඩබ්ලිව්. සමරසූරිය මහතා, 'සමරසිරි', කෝට්ටේගොඩ.

හා

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ –

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් 2007.09.05 දිනැති මාණ්ඩලික අනුකාරක සභා අභියාචනා නියෝගය අනුව රුහුණු ප්‍රාදේශිකයේ III බී ශ්‍රේණියේ නිලධාරී ඒ. ඩබ්ලිව්. සමරසූරිය මහතා වෙත පමුණුවනු ලැබූ දඬුවම් යුක්ති සහගතද යන්න හා යුක්ති සහගත නොවේ නම්, ඔහුට කුමන සහනයක් හිමිද යන්න පිළිබඳව ද වේ.

ඩබ්ලිව්. ජේ. එල්. යූ. විජයවීර,
කම්කරු කොමසාරිස්.

2009 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් තැනගේ කාර්යාලයේදී දින යොදන ලදී.

02 – 104

---

මගේ අංකය: අයිආර්/21/02/2009.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4(1) වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්,

සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත (යූනියන් පෙදෙස), කොළඹ 02

හා

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන්, පී.එල්.සී, අංක 248, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය, අතාවුද සෙනෙවිරත්න වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77 හි, ටී. පියසෝම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

අතාවුද සෙනෙවිරත්න,
කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය.

2010 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/21/02/2009.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත (යූනියන් පෙදෙස), කොළඹ 02

හා

ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන්, පී.එල්.සී., අංක 248, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

**අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ –**

ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන්, පී.එල්.සී. විසින් මෙහි පහත නම් සඳහන් සේවකයින් විසිඅට දෙනා (28) සිය කැමැත්තෙන් එම සමාගමේ රැකියාව අත්හැර ගියා සේ සැලකීම යුක්තිසහගත ද යන්න හා යුක්තිසහගත නොවේ නම්, ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමි ද යන්න පිළිබඳව වේ:

(1) එල්. එච්. ජගත් වික්‍රමසිංහ
(2) ආර්. ඒ. වීරසිංහ
(3) ඩී. ජී. සිරිමෙවන් ආටිගල
(4) එස්. එල්. විජිත චමින්ද
(5) ඇන්ටනි ස්කොට්
(6) එච්. කේ. රසික ප්‍රියංකර ප්‍රනාන්දු
(7) බී. ඒ. අසන්ත සංජීව පෙරේරා
(8) එම්. ධනුෂ්ක පීරිස්
(9) ඩබ්ලිව්. එච්. සී. ප්‍රසාද් ප්‍රනාන්දු
(10) ඩී. අනෝජ් චින්තක බාලචන්ද්‍ර
(11) ජේ. ඒ. අජන්ත ජයසිංහ
(12) කේ. එල්. එස්. නිලූෂන
(13) චමත් ප්‍රසන්න විජේනායක
(14) කේ. පී. එල්. අමිල කරුණානායක
(15) එම්. කේ. නුවන් කුමාර අල්විස්
(16) චමිල කුමාර සුරවීර
(17) දිනේෂ් සංජීව සෝමසිරි
(18) ජේ. ඒ. ලාල් ජයසූරිය
(19) ඩී. ජී. වසන්ත කුමාර
(20) මුදුන්කොටුවගේ සුරංග සංජීව
(21) කේ. එම්. ලාල්
(22) කේ. ඒ. ගාමිණී කුමාරසිංහ
(23) ජේ. පී. ජස්ටින් රාජ්
(24) කේ. ජෙබම්
(25) ඩබ්ලිව්. ඒ. අනුරුද්ධ ප්‍රදීප් කුමාර
(26) එම්. එම්. සමිත චන්දිමාල්
(27) එම්. ඩී. ගාමිණී වීරසිංහ
(28) කේ. ඩී. සුමිත් මංජුල

ඩබ්ලිව්. ජේ. එල්. යූ. විජයවීර,
කම්කරු කොමසාරිස්.

2010 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස්තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

02 – 105

---

මගේ අංකය: අයිආර්/22/10/2008.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ජේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4(1) වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්,

සී. ජී. ද අල්විස් සෙනෙවිරත්න මහතා, අංක 200, හයිලෙවල් පාර, කිරුළපන, කොළඹ 06

හා

අනෙක් පාර්ශ්වය වශයෙන්,

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම, අලෙවි අංශය, හුණුපිටිය, වත්තල

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය, අතාවුද සෙනෙවිරත්න වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන

පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 05, කිරුළපන ඇවනියු, අංක 153/1, වී. විමලරජා මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

අතාවුද සෙනෙවිරත්න,
කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය.

2010 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/22/10/2008.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

සී. ජී. ද අල්විස් සෙනෙවිරත්න මහතා, අංක 200, හයිලෙවල් පාර, කිරුළපන, කොළඹ 06

හා

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම, අලෙවි අංශය, හුණුපිටිය, වත්තල

අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ –

(1) සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් එහි අලෙවි කළමනාකරු සී. ජී. ද අල්විස් සෙනෙවිරත්න මහතා 1994 ජනවාරි මස 19 වැනි දින සිට අනිවාර්ය නිවාඩු ගත්වා, විනය පරීක්ෂණයකින් තොරව 1994 මාර්තු මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එය වැඩ තහනම් කිරීමක් බවට පත් කිරීම හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා එවැනි අසාධාරණයක් වූයේ නම්, ඔහුට කුමන සහනයක් හිමි ද,

(2) සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් සී. ජී. ද අල්විස් සෙනෙවිරත්න මහතා 1994 අගෝස්තු මස 01 වැනි දින නැවත සේවයේ පිහිටුවා නැවත 1994 අගෝස්තු මස 04 වැනි දින සිට සේවයට වාර්තා කිරීමට ඉඩ ලබා නොදීමේ හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් වූයේ ද යන්න හා අසාධාරණයක් සිදුවූයේ නම් ඔහුට කුමන සහනයක් හිමි ද,

(3) සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් 1997 සැප්තැම්බර් මස 15 වැනි දින සිට සී. ජී. ද අල්විස් සෙනෙවිරත්න මහතාට ඔහුගේ කණිෂ්ඨ නිලධාරිණියක් යටතේ සේවය කිරීමට නියම කිරීමේ හේතුව මත අනුමිතික ලෙස සමාගමේ සේවය අවසන් කිරීමක් ඔහුට සිදුවූයේ ද යන්න හා එසේ වූයේ නම්, ඔහුට කුමන සහනයක් හිමි ද යන්න හා,

(4) සී. ජී. ද අල්විස් සෙනෙවිරත්න මහතා 1994 ජනවාරි මස 19 වැනි දින සිට සමාගමේ සේවයට විධිමත්ව බඳවා නොගැනීම තුළ යම් අසාධාරණයක් සිදුවී ද, සිදුවී නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ.

ඩබ්ලිව්. ජේ. එල්. යූ. විජයවීර,
කම්කරු කොමසාරිස්.

2009 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස්තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

02 – 106



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.